# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1989 මැයි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1989 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 14/89.

## 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1989 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1981 අංක 69 දරන පනතේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඊ) ඒ ගනුදෙනුවට ආරෝපනය කළ හැකි පිරිවැටුම් බද්ද සහ 50අ වගන්තිය යටතේ අඩු කරගත් රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද;".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි XVඅ අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ XV වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ XVඅ පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුතු ය:—

### "XVඅ පරිච්ඡේදය

### ආනයනකරුවන් සහ සාදන්නන් විසින් කරනු ලබන විකුණුම් මත රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද අඩු කිරීම.

ආනයනකරුවන් හා සාදන්නන් විසින් කරනු ලබන විකුණුම් මත වූ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද.

50අ. (1) මේ පනතේ කුමක් සඳහන් ව තිබුණද, 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව—

(අ) 12 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි වූ යම් ආනයනකරුවකු විසින් ; හෝ

(ආ) යම් සාදන්නකු විසින්

ඒ ආනයනකරු වශයෙන් හෝ සාදන්නා වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේ දී (මෙහි මින් මතු "මිලට ගන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට (බැහැර කරන ලද භාණ්ඩයක් හැර) යම් භාණ්ඩයක් විකුණනු ලබන අවස්ථාවක, ඔහු විසින්, ඒ විකිණීම මත ලැබුණු හෝ ලබා ගැනීමට හැකි මුදල් ප්‍රමාණය 5 වන වගන්තියේ අර්ථානුකූල ව ආනයනකරුගේ හෝ සාදන්නාගේ පිරිවැටුමේ කොටසක් වන අවස්ථාවක, ඒ මුදල් ප්‍රමාණයෙන් සියයට එක බැගින් ගණන් බලන ලද (මෙහි මින් මතු "රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද" යනුවෙන් හැඳින්වෙන) බද්දක් අඩුකර ගත යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද අඩු

කිර ගන්නා සෑම ආනයනකරුවකු හෝ සාදන්නකු විසින්—

(අ) ඒ භාණ්ඩයේ මිලට ගන්නා වෙත—

(i) තමාගේ නම සහ තැපැල් ලිපිනය ;

(ii) මිලට ගන්නාගේ නම සහ තැපැල් ලිපිනය ;

(iii) විකිණීම ගනුදෙනුව වෙනුවෙන් ලැබුණු හෝ ලැබිය හැකි මුදල් ප්‍රමාණය ;

(iv) ගනුදෙනුවට ඇතුළත් වූ දිනය ;

(v) ඒ විකිණීමේ ගනුදෙනුවට ආරෝපණය කළ හැකි රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද ; සහ

(vi) 46 (2) වගන්තිය යටතේ ඔහු විසින් දැක්විය යුතු බවට නියම කර ඇති වෙනත් යම් විස්තර

දක්වමින් වවුචරයක් නිකුත් කළ යුතු ය ;

(ආ) රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද අඩුකර ගැනීමට යෙදුනේ කවර ගනුදෙනුවක් වෙනුවෙන් ද, ඒ ගනුදෙනුව සිදු වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද සමග රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද වශයෙන් අඩුකර ගන්නා ලද මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය.

(3) පිරිවැටුම් බද්දට යටත් යම් තැනැත්තකුගේ පිරිවැටුමෙහි මෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති පරිදි, රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද අඩු කර ගන්නා ලද යම් භාණ්ඩයක් විකිණීමෙන් ලබා ගන්නා ලද හෝ ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් ඇතුළත් වන අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ ඒ රඳවාගැනීමේ පිරිවැටුම් බද්දට අදාළ ව ඔහු වෙත නිකුත් කරන ලද වවුචරය ඉදිරිපත් කිරීම මත, ඔහු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ වවුචරයේ දක්වා ඇති රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද අඩු කරනු ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතු ය :

එසේ වුව ද එවැනි අඩු කිරීමක්—

(අ) යම් ව්‍යාපාරයක ප්‍රයෝජනය සඳහා මිලට ගන්නා ලද යම් පිරියතක්, යන්ත්‍ර, සවිකිරීම්, ගොඩනැගිලි, වාහන හෝ වෙනත් ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් ; හෝ

(ආ) (i) 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් යම් ව්‍යාපාරයක ප්‍රයෝජනය සඳහා ; හෝ

(ii) යම් බැහැර කරන ලද භාණ්ඩයක් සෑදීමේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා මිලට ගන්නා ලද යම් භාණ්ඩයක් වෙනුවෙන්

අඩු කර ගන්නා ලද රඳවා ගැනීමේ පිරිවැටුම් බදු සම්බන්ධයෙන් නොකළ යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් (3) වන උපවගන්තිය යටතේ අඩු කරනු ලැබිය හැක්කේ යම් රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් ද ඒ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දට වැඩිවන ප්‍රමාණය ඒ තැනැත්තාට ආපසු නොගෙවිය යුතු නමුත්, ඒ තැනැත්තා විසින් තදනන්තර කාර්තුව යනාදි වශයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් අඩුකර ගත හැකි ය.

මේ පනතේ විධිවිධාන රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දට අදාළ කිරීම.

50ආ. වාර්තා සැපයීමට, බදු ගෙවීමට, බදු අයකර ගැනීමට, ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩන පැනවීමට සහ පිරිවැටුම් බදු ආපසු ගෙවීමට අදාළ මේ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු රඳවාගැනීමේ පිරිවැටුම් බද්දට අදාළව හෝ ඒ පිළිබඳව වාර්තා සැපයීමට, බදු ගෙවීමට, බදු අයකර ගැනීමට, ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩන පැනවීමට හා ආපසු ගෙවීමට අදාළ විය යුතු ය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (අ) ඡේදයේ "50 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ" යන වචන හා ඉලක්කම් වෙනුවට "50 වන වගන්තියේ (1) වන උප වගන්තියේ හෝ 50අ වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (2) වන උප වගන්තියේ හෝ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් සම්බන්ධයෙන් සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.